**ශීර්ෂය 119 - විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

---

## 1.1 විගණන විෂය පථය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජුනි 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

(i) ණය ලිපිගොනු, පෞද්ගලික ලිපිගොනු ආදී වූ අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශයෙහි නොතිබීම නිසා එකතුව රු.209,047 ක ණය ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ii) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදන හා වියදම්**

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.34,290,340,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.32,665,105,333 ක් උපයෝජන කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.1,625,234,667 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.74 ක ප්‍රමාණයක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය** | **2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය** | **2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 1,083,340,000 | 1,074,240,000 | 615,678,645 | 57.31 |
| මූලධන | 32,500,000,000 | 33,216,100,000 | 1,009,556,022 | 2.94 |
| එකතුව | 33,583,340,000 | 34,290,340,000 | 1,625,234,667 | 4.74 |

**(ii) අයවැය විචලනය**

වැය විෂයයන් 09 ක් සඳහා සළසා තිබුණු රු.529,849,700 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. වැය විෂයයන් 13 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 45 ත් සියයට 94 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 11901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 5,000,000 | 2,191,116 | 2,600,000 | 3,310,776 | 20,000,000 | 10,605,220 |

විෂය අංක 11901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.225,442 ක් වී තිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ රු.16,130,664 ක්වූ හර ශේෂයක් තිබුණි.

(ඉ) පොදු තැන්පත් ගිණුම

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු.8,610,783 ක් වූ අතර ඒ තුළ අන්තර්ගත වර්ෂ 2 ක් ඉක්මවූ රු.197,523 ක තැන්පතුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික කාර්යසාධන වාර්තා**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 401 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු 2012 වර්ෂය සඳහා වූ ආමාත්‍යාංශ කාර්යසාධන වාර්තාව දින 147 ක ප්‍රමාදයකින් පසුව 2013 ඔක්තෝබර් 23 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

එකතුව රු. 7,000,000 ක් පිරිවැය වූ වාහන 04 ක් රජයේ මණ්ඩලයක් වෙත මුදාහැර තිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

රජයේ මණ්ඩලයට අයත් වාහන 2 ක් අමාත්‍යාංශය විසින් පරිහරණය කර තිබුණි.

## 1.6 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) | මුදල් රෙගුලාසි 103(1) | 517,107 | වාහන 4 ක අනතුරු සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි නොකර අමාත්‍යාංශයට සිදුවූ පාඩු ලෙස පොත් වලින් කපා හැර තිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 104 (3) හා (4) | 602,956 | පාඩුවක් හෝ අලාභහානියක් හෝ සිදුවූ වහාම පරීක්ෂණ ආරම්භ කර ප්‍රාරම්භක වාර්තා හා පූර්ණ වාර්තා තුන් මසක් ඇතුළත ඉදිරිපත් නොකර පරීක්ෂණ කටයුතු වසර 2 සිට 6 දක්වා කාල පරාසයක් තුළ සිදුකර තිබීම හා අලාභහානි පොත් වලින් කපා හැර තිබුණි |

## 1.7 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳව තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යා | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 13 | 4 | - |
| (ii) | තෘතීයික මට්ටම | 4 | 1 | 3 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 64 | 43 | 21 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 46 | 35 | 11 | - |
| (v) | වෙනත් | 1 | 20 | - | 19 |
| | **එකතුව** | **132** | **112** | **39** | **19** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 39 ක් පිරවීමට අපොහොසත් වී තිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් නොමැතිව බඳවා ගෙන තිබූ අතිරික්ත සේවක සංඛ්‍යාව 19 ක් විය.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස ලබා ගත් මානව සම්පත් පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවා ගෙන තිබුණු අධිකාරියකට අයත් රියදුරෙකුගේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.718,835 ක්ද, 2010 මැයි සිට 2011 දෙසැම්බර් දක්වා රු.738,195 ක්ද අමාත්‍යාංශ නියෝග පරිදි රජයේ මණ්ඩලයක් විසින් එම අධිකාරියට ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ii) විධිමත් අනුමැතියකින් තොරව මණ්ඩලයක නිලධාරීන් 24 දෙනෙකු අමාත්‍යාංශයේ සේවයේ යොදවා තිබුණි. ඒ වෙනුවෙන් මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී රු.20,074,851 ක වැටුප් හා දීමනා සහ රු.1,488,106 ක දිරි දීමනා ගෙවා තිබුණි.

.